CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# <u>මාධ්‍ය නිවේදනයයිඃ</u>

## ***විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුම (MOU) අත්සන් කිරීම සම්බන්ධවයි.***

**දිනයඃ 2017 මාර්තු 09 වන බ්‍රහස්පතින්දා,** කොළඹ, ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ දී ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කැබිනට් අමාත්‍යාංශයක් සමඟ ඇතිකරගත් පළමු අවබෝධතා ගිවිසුම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය අතර මාර්තු 09 වන බ්‍රහස්පතින්දා අත්සන් කෙරිණි. අමාත්‍යාංශවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ භාෂා සමීක්ෂණයක් සිදු කිරීමට අදාළව මෙම අවබෝධතා ගිවිසුම අත්සන් තබන ලදී.

භාෂා ගැටලු විසඳීම  සම්බන්ධයෙන් බිම් මට්ටමින් කටයුතු කළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2016 වසරේ සිට ජාතික මට්ටමින් භාෂා ගැටලු විසඳීමට ප්‍රවේශ විය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතනවල පූර්ණ දායකත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණකි. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරීම වර්ෂ 2009/09/25 දින නිකුත් කරල ලද අංක 1620/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 2009/11/25 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2009 මඟින් සිදු කර ඇත.

ඒ අනුව ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් රාජ්‍යා ආයතන මඟින් භාෂා සැලසුම් පිළියෙළ කිරීමේ මාර්ගෝපදේශ අත් පොත සම්පාදනය කරන ලද අතර ඒ ඔස්සේ රාජ්‍ය ආයතනවල භාෂා සැලසුම් සකස් කිරීම හා මඟපෙන්වීම භාෂා සැලසුම් පහසුකරණ වැඩ සටහන මඟින් සිදු කරන ලදී. එම මඟ පෙන්වීම ඔස්සේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රධාන අංශ 04ක් සම්බන්ධයෙන් අවධානය යොමුකරනු ලැබී ය. එනම්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කිරීම, පරිපාලනය හා ලේඛන සකස් කිරීම, සේවා සැපයීම සහ  ආයතනික කැපවීම හා උපකාරක යාන්ත්‍රණය යි.

අමාත්‍යාංශ මට්ටමින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය වඩාත් වේගවත් හා එහි ඵලදායීතාවය පිළිබඳ ඇගයීමක් සිදු කිරීම මඟින් අදාළ ආයතනයන්හි වර්තමාන ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම කාලෝචිත බව හැඟේ. ඒ සඳහා අමාත්‍යාංශවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට අපේක්ෂිතය.